**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ක්‍රීඩා අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දිමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 25 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරුවන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත්, වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1) (අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියලු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම | 2.7 |
| | | 2. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.8 |
| 127 (1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතු වීම. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.9 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අලුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකිවන පිණිස සැකැයක් හෝ උද්ගත වී ඇති සියලු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වාහන උපයෝජනයේ අඩුපාඩු<br>2. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.3(අ)<br>2.3 (ආ) |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව. | සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.4 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

---------------------------------------------------

**2.3 කාර්යසාධනය**

---------------

**2.3.1 කාර්යභාරයන් ඉටු කිරීම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

-----------------------------------------

ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ ක්‍රීඩාංගන 200 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 560 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සඳහා රු.මිලියන 33.68 ක් අතිරේක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි. දිස්ත්‍රික්ක 22 ක දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් ක්‍රීඩාංගන 332 ක් සංවර්ධනය කිරීම ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත රු. මිලියන 367.4 ක් ප්‍රතිපාදන වෙන් කර දී තිබුණි. අදාළ දිස්ත්‍රික් ලේකම්වරු විසින් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 133.5 ක් වැය කර ක්‍රීඩාංගන 161 ක වැඩ අවසන් කර තිබුණි. ක්‍රීඩාංගන 171 ක වැඩ අවසන් කර නොතිබුණි.

**(ආ) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ ධාවන පථය**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණයේ මීටර් 400 සහ මීටර් 200 ධාවන පථය නැවත ඇතිරීම සඳහා 2017 වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 200 ක් සහ රු. මිලියන 250 ක ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 56.32 ක් වැය කර සියයට 20 ප්‍රමාණයක වැඩ පමණක් අවසන් කර තිබුණි.

**(ඇ) ශ්‍රී ලාංකිකයින් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහණ**

2016 වර්ෂයේදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරඟාවලි 08 කට සහභාගි වී රන් 30, රිදී 71 ක් සහ ලෝකඩ 107 ක් වශයෙන් පදක්කම් 208 ක් හිමිකර ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තරඟාවලි 08 කට සහභාගි වී රන් 29, රිදී 39 ක් සහ ලෝකඩ 11 ක් වශයෙන් පදක්කම් 79 ක් පමණක් ලබා ගෙන තිබුණි.

## 2.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය විසින් නුවරඑළිය ක්‍රීඩා නිවහන ඉදිකිරීම සහ පාසල් දහසක ක්‍රිකට් ක්‍රීඩාව නැංවීම යන ව්‍යාපෘති 02 ක සඳහා පිළිවෙලින් රු.මිලියන 200 ක් සහ රු.මිලියන 250 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී සලසා තිබුණි. ඉන් පළමු ව්‍යාපෘතිය 2018 ජුනි මස වැඩ නිමකළ යුතු වුවද එදිනට වැඩ නිමකර නොතිබුණු අතර දෙවැනි ව්‍යාපෘතිය මාස 03 ක කාල පමාවකින් පසුව නිමකර තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාහන උපයෝජනය**

**ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය ප්‍රකාර අමාත්‍යාංශය සතු වාහන 2 ක ඉන්ධන දහනය වීම පරීක්ෂාව සිදු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශයට අයත් මොටර් කාර් රථයක් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය වෙත මුදාහැර තිබුණු අතර එය මෙතෙක් අමාත්‍යාංශ යටතට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 342.6 | 270.9 | 71.7 | 21 |
| | මූලධන | 552.6 | 348.0 | 204.6 | 37 |
| | **එකතුව** | **895.2** | **618.9** | **276.3** | **31** |
| 2014 | පුනරාවර්තන | 403.3 | 380.0 | 23.3 | 6 |
| | මූලධන | 806.9 | 498.2 | 308.7 | 38 |
| | **එකතුව** | **1210.2** | **878.2** | **332.0** | **27** |
| 2015 | පුනරාවර්තන | 457.6 | 400.4 | 57.2 | 12 |
| | මූලධන | 801.8 | 623.4 | 178.4 | 22 |
| | **එකතුව** | **1259.4** | **1023.8** | **235.6** | **18** |
| 2016 | පුනරාවර්තන | 475.7 | 436.5 | 39.2 | 8 |
| | මූලධන | 1160.0 | 779.8 | 380.2 | 33 |
| | **එකතුව** | **1635.7** | **1216.3** | **419.4** | **25** |
| 2017 | පුනරාවර්තන | 460.4 | 409.4 | 51.0 | 11 |
| | මූලධන | 3108.8 | 1281.8 | 1827.0 | 58 |
| | **එකතුව** | **3569.2** | **1691.2** | **1878.0** | **53** |

සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 3 ක් සඳහා සලසා තිබුණු රු.334,620,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 63 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 97 දක්වා අතර පරාසයක පැවතිණි.

**2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12.30 | 12.25 | 5.00 | 5.53 | 30.00 | 21.53 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.251,176 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණද, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**2.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

2017 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ නිල බැංකු ගිණුමේ වූ රු.142,340 ක් වූ ශේෂය විසර්ජන ගිණුමේ බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ දක්වා නොතිබුණි.

**2.7 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම.**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇප ලේඛනය පවත්වා නොතිබුණු අතර, ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්නා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාළ රෙගුලාසි |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

## 2.8 අභ්‍යන්තර විගණනය

මුදල් කටයුතු වලට අදාළ අභ්‍යන්තර විගණන වැඩ සටහන පිළියෙල කර තිබුණද අභ්‍යන්තර විගණන වැඩසටහනේ ඇතුළත් ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේ කාර්යය ඉටුකර නොතිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 119.6 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.691,560 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 32 | 18 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 15 | 09 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 109 | 69 | 40 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 83 | 73 | 10 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික කොන්ත්‍රාත්) | 04 | 04 | - |
| | එකතුව | 243 | 173 | 70 |